පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 12 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ..........................................................................

පාසලේ නම : ..........................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය :

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව 1<br>Geography 1 | 22 S I | පැය තුනයි විනාඩි දහයයි.<br>*Three hours&10 minutes* |

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන් විත වේ.**
- **පළමු කොටස ප්‍රශ්න හතලියකින් සමන්විත වන අතර ඒ සියල්ලට පිළිතුරු සපයන්න**
- **එක් එක් ප්‍රශ්නයට පිළිතුරු පහ බැගින් ඇති අතර නිවැරදි පිළිතුර ඊට අදාළ ඉර මත ලියන්න**
- **II කොටසේ ප්‍රශ්න දෙකටම පිළිතුරු සැපයිය යුතු අතර III ප්‍රශ්න දෙකක පමණක් පිළිතුරු සැපයි යුතුය**

1. 1:50,000 ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියමක 10 cm x 6 cm ක විශාලත්වයෙන් යුතු කුඹුරු යායක සැබෑ වර්ග ප්‍රමාණය දක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
   (1) 4 $km^2$   (2) 8.75 $km^2$   (3) 10.75 $km^2$   (4) 15 $km^2$   (5) 25$km^2$   (..........)

2. කිලෝමීටර් හතරක් සිතියමක දැක්වෙන්නේ සෙන්ටි මීටර් දාසයකිනි. එම සිතියමේ පරිමාණය වන්නේ
   1) 1:50000   3) 1:25000   5) 1:20000
   2) 1:10000   4) 1:100000   (..........)

3. 1:50000 සිතියම් ගණන හා මුද්‍රිත සිතියම් කොටස් ගණන වන්නේ
   1) 92 හා 91   3) 92 හා 90   5) 90 හා 89
   2) 92 හා 88   4) 92 හා 89   (..........)

4. ශ්‍රී ලංකාවේ 1:50000 භූ ලක්ෂණ සිතියමක සංකේත හා වර්ණය නොගැලපෙන පිළිතුර වන්නේ
   1) රතු කතිරය - රෝහල   3) වැව් බැම්ම - කළු රේඛාව   5) නගර සීමා - රතු කඩඉරි
   2) කළු කොටුව - ගොඩනැගිලි   4) අඩිපාර - කළු කඩඉරි   (..........)

5. ප්‍රාගෝගික භූගෝල විද්‍යාවේ විවිධ ශිල්ප ක්‍රම භාවිතා කරයි. එවැනි ශිල්පක්‍රමයක් නොවන පිළිතුර වන්නේ
   1) සිතියම්   3) සංඛ්‍යානය   5) ගුවන්යානා තක්ෂණය
   2) පරිගණක ශිල්ප ක්‍රම   4) ප්‍රස්තාර   (..........)

6. ගෝලීය ස්ථානගතකිරීමේ පද්ධතිය හා සම්බන්ධ වැදගත් ස්ථානයක් නොවන්නේ
   1) හවායි   3) දියාගෝ ගාසියා   5) වොෂිංටන් ඩීසී
   2) කවාජලින්   4) ඇෂෙන්සන්   (..........)

7. ගෝලීය ස්ථානගත කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන අතිරේක චන්ද්‍රිකා ගණන හා ගමන් කරන කක්ෂමාර්ගයක ගමන් කරන චන්ද්‍රිකා ගණන වන්නේ
   1) 7 හා 8   3) 24 සහ 12   5) 24 සහ 6
   2) 7 සහ 12   4) 7 සහ 4   (..........)

EDNCP

8. 1:100000 සිතියමක රේඛිය පරිමාණය දක්වන විට රේඛාව බෙදාගතයුතු සෙන්ටිමටර්

1) සෙන්ටිමීටර් 2කිනි.
2) සෙන්ටිමීටර් 4කිනි.
3) සෙන්ටිමීටර් 1කිනි.
4) සෙන්ටිමීටර් 10කිනි.
5) සෙන්ටිමීටර් 20කිනි.

(..........)

9. යම්කිසි ස්ථානයක නිවැරදි පිහිටීම දක්වන නවතම තාක්ෂණික ක්‍රමවේදය වන්නේ

1) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය
2) දුරස්ථ සංවේදක
3) සිතියම් ස්කෑන්කරණය
4) භූගෝලීය තොරතුරු පද්ධතිය
5) අංකික සිතියම්කරණය

(..........)

10. දූරස්ථ සංවේදන ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් නොවන්නේ

1) ශක්ති මූලාශ්‍රය
2) වස්තුව
3) සංවේදකය
4) යෙදවුම
5) අක්‍රිය සංවේදක

(..........)

11. වායුගෝලයට හරිතාගාර වායු විමෝචනය කරන ප්‍රධානම අංශය වන්නේ

1) කාර්මික
2) බලශක්ති
3) වානිජ
4) ප්‍රවහාන
5) කෘෂිකාර්මික

(..........)

12. කඩුගන්නාව නයිස්, කතරගම කඳු යන ප්‍රදේශවල දක්නට ලැබෙන පාෂාණ අයත් වන්නේ

1) මයෝසීන පාෂාණ
2) විජයානු ශ්‍රේණියේ පාෂාණ
3) ජුරාසික පාෂාණ
4) වන්නි පාෂාණ
5) උස්බිම් පාෂාණ

(..........)

13. දැඩි ස්වභාවික රක්ෂිතයක් පමණක් ඇතුලත් පිළිතුර වනුයේ

1) හග්ගල
2) සිංහරාජ
3) විල්පත්තුව
4) වික්ටෝරියා
5) රන්දෙනිගල

(..........)

EDNCP

14. ශ්‍රී ලංකාවේ වියළි හා තෙත් කලාප දෙකටම අයත් ගංගාව වන්නේ

1) කැළණි ගඟ
2) මහ ඔය
3) කළු ගඟ
4) මල්වතු ඔය
5) මහවැලි

(..........)

15. ශ්‍රී ලංකාවේ ගංගා අතරින් ප්‍රධාන විශාලතම පෝෂක ප්‍රදේශය සහිත ගංග වන්නේ

1) කැළණි ගඟ
2) මහ ඔය
3) කළු ගඟ
4) මල්වතු ඔය
5) මහවැලි

(..........)

16. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලාශවලට යටවී ඇති බිම් ප්‍රමාණය වන්නේ වර්ග කිලෝමීටර

1) 2010
2) 2805
3) 2080
4) 2950
5) 2905

(..........)

17. ඊතලයෙන් පෙන්නුම් කරන ප්‍රදේශයෙහි ක්‍රියාත්මක වන සුළි සුළං හඳුන්වන ප්‍රදේශීය නම වන්නේ



1) විලි විලිස්
2) ටයිෆූන්
3) සයික්ලොලොන්
4) බැගියෝ
5) හරිකේන්

(..........)

(..........)

18. කඩුගන්නාව නයිස් පාෂාණය අයත් වන්නේ

1) මෙසෝසොයික අවධියට
2) තෘතියික අවධියට
3) චාතුර්ථක අවධියට
4) ප්‍රාග් කෙම්බ්‍රීජය අවධියට
5) පෙලියෝසොයික අවධයට

19. ග්‍රාමීය ජනාවාස ධුරාවලියේ ඉහළම ධුරාවලි මට්ටම වන්නේ

1) ගොවිපොල
2) නගරයාය
3) ගම
4) පුරවරය
5) කුඩාගම

(..........)

20. සෑම වසරකම ජුනි පස් වැනිදා සමරනු ලබන්නේ

1) වසංගත දිනය
2) ජල දිනය
3) පරිසර දිනය
4) තෙත් බිම් දිනය
5) සෞඛ්‍ය දිනය

(..........)

21. ලොව නාගරීකරණය අඩුම රට වන්නේ

1) බුරුන්ඩි
2) නේපාලය
3) ට්‍රිනිඩෑඩ් හා ටොබැගෝ
4) චැඩ්
5) මලාවි

(..........)

22. නිවර්තන කලාපයේ දක්නට ලැබෙන ප්‍රධානතම වනාන්තර වර්ගය වන්නේ

1) නිවර්තන මොසම් වනාන්තර
2) නිවර්තන සැවානා සැවානා
3) මධ්‍යධරණි වනලැහැබ්
4) නිවර්තන වර්ෂා වනාන්තර
5) නිවර්තන කලාපීය වනාන්තර

(..........)

23. කාලගුණික හා දේශගුණික මූලිකාංගවලට අයත් නොවන අංගය වන්නේ

1) උෂ්ණත්වය
2) වර්ෂණය
3) උන්නතාංශය
4) ආර්ද්‍රතාවය
5) වායු පීඩනය

(..........)

24. පුනිල මෝය ඩෙල්ටාවට නිදසුන් ලෙස දැක්විය හැකි ගංගාව වන්නේ

1) සේන් ගඟ
2) ටයිබර් ගඟ
3) නයිල් ගඟ
4) මිසූරි මිසිසිපි ගඟ
5) මහවැලි ගඟ

(..........)

25. කඳුකර ග්ලැසියර් නිර්මාණය අශ්‍රිත බාදිත හා නිධිසාධිත භූරූප දෙකක් වන්නේ

1) සර්කර් හා මොරේන
2) පිරමිඩාකාර මුදුන් හා කේම
3) ක්වාම් හා එස්කර්
4) සර්කර් හා අරේටර්
5) ඩ්‍රම්ලීන හා ආරේටර්

(..........)

26. ජල චක්‍රයේ ප්‍රධාන සංරචකවලට ඇතුලත් **නොවන** සංරචකය වන්නේ

1) ඝනීභවනය
2) වර්ෂණය
3) වාෂ්පි - උත්වේදනය
4) අපිධාවිතය
5) වර්ෂාපතනය

(..........)

27. ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනයේ මධ්‍යනය අගය වන්නේ මිලි මීටර්

1) මි.මී 1861
2) මි.මී1920
3) මි.මී 1610
4) මි.මී1250
5) මි.මී1875

(..........)

28. ලෝක ජන සංඛ්‍යාවේ වැඩිම ජන ප්‍රමාණයක් සහිත රටවල් කාණ්ඩය අවරෝහණ පිළිවෙළට වන්නේ

1) චිනය, ඉන්දියාව, ඇ.එ.ජ, ඉන්දුනීසියාව
2) චිනය, ඉන්දියාව, ඇ.එ.ජ, බංග්ලාදේශය
3) චිනය, ඉන්දියාව, ඇ.එ.ජ, බ්‍රසීලය
4) ඉන්දියාව, චිනය , ඇ.එ.ජ, ඉන්දුනීසියාව
5) ඉන්දියාව, චිනය, ඇ.එ.ජ, නයිජීරියාව

(..........)

29. ශ්‍රී ලංකාව ආසන්නයේ ගිණිගැනීමකට ලක්වූ එක්ස්පස් ෆර්ල් නෞකාව ලියාපදිංචි කර ඇති රට වන්නේ

1) ඇමරිකාව
2) චිනය
3) සිංගප්පූරුව



EDNCP

4) ඉරානය 5) තායිලන්තය (………..)

30. යුරෝපා කලාපයට අයත් ඉපැරණිම ප්‍රධාන නගර දෙකක් වන්නේ

1) ඇම්ස්ටර්ඩෑම් හා ජිනිවා
2) රෝමය හා ඇතැන්ස්
3) ඔස්ලෝ හා ස්ටොක්හොම්
4) උර් හා එරිදු
5) මොහෙන්දජාරෝ හා හරප්පා

(………..)

31. වර්තමානයේ යුධ ගැටුම් උග්‍ර රටවල් දෙක

1) යුක්රේනය හ රුසියාව
2) ඉන්දියාව හා පකිස්ථානය
3) සිරියාව හා තුරුකිය
4) ඊශ්‍රයලය හා පලස්තීනය
5) ජෝර්දානය හා යේමනය

(………..)

32. ලොව වැඩිම බහුජාතික සමාගම් අයත් රට වන්නේ

1) ඇ.එ.ජ 2) ජපානය 3) බ්‍රිතාන්‍ය 4) චීනය 5) රුසියාව

(………..)

33. නාගරීකරණ ප්‍රතිශතය සියයට පනහක් වූ වර්ෂය වන්නේ

1) 2006 2) 2007 3) 2008 4) 2009 5) 2012

(………..)

34. ලෝකයේ එක් එක් රටවල් සම්බන්ධ වීම කෙරෙහි (ගෝලියකරණය) කෙරෙහි අතිතයේදී දායක වූ සාධකයක් **නොවන්නේ**

1) වෙළදාම
2) දේශගවේශණය
3) යටත්විජිත කරණය
4) ආක්‍රමණ
5) සිග්‍රමානව සංචලන

(………..)

35. ලෝකයේ මුලින්ම ශිෂ්ටාචාර ඇති වුයේ

1) ඛනිජ සම්පත් බහුල ප්‍රදේශවල
2) දේශගුණිකත්වය විවිධත්වයක් සහිත ප්‍රදේශවල
3) ආරක්ෂිත කදුකර ප්‍රදේශවල
4) දඩයම් කළ හැකි සැවනා ප්‍රදේශවල
5) වගාකළ හැකි ගංගා නිම්න ආශ්‍රිතව

(………..)

EDNCP

36. සවිධි ජනායවාසයක ප්‍රධාන ජනාවාස රටා තුන වන්නේ

1) නාභිගත, රේඛිය, ආකිර්ණ
2) නාභිගත, රේඛිය, සැළසුම් සහගත
3) නාභිගත, රේඛිය, හුදකලා
4) නාභිගත, රේඛිය, නිහැඩ
5) නාභිගත, රේඛිය, විකිර්ණ

(………..)

37. ශ්‍රී ලංකාවේ ජනගහන ප්‍රක්ෂේපණයට අනුව 2041 වයස්ගත ජන ප්‍රතිශතය වන්නේ

1) 2.8%
2) 3.8%
3) 12.8%
4) 24.8%
5) 48%.

(………..)

38. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මාන්තයට හරිත විප්ලවයේ බලපෑම සිදු වූයේ

1) 1960 දශකයේ මුල්භාගයේ
2) 1960 දශකයේ මැදභාගයේ
3) 1960 දශකයේ අගභාගයේ
4) 1970 දශකයේ මුල්භාගයේ
5) 1960 දශකයේ අගභාගයේ

39. මහද්වීප අනුව පෙළගැස්මේ දී ජන සංඛ්‍යාව අතින් දෙවන ස්ථානය ගන්නා මහද්වීපය වන්නේ

1) ආසියාව
2) අප්‍රිකාව
3) දකුණු ඇමරිකාව
4) උතුරු ඇමරිකාව
5) යුරෝපය

(………..)

40. ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික අංශයක් ලෙස නොගන්න පිළිතුර වන්නේ

1) වාරි තාක්ෂණය
2) හරිත විප්ලවය
3) ජාන තාක්ෂණය
4) ඓන්ද්‍රීය කෘෂිකර්මාන්තය
5) සාම්ප්‍රදායික කෘෂිකර්මානතය

(………..)

## II කොටස

1. ශ්‍රී ලංකාවේ මිනින්දොරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරන ලද 1:50000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියම් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය මීටර් 20කි. එම සිතියම පදනම් කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

   i. සිතයම්ගත ප්‍රදේශයේ වර්ගඵලය ගණනය කරන්න (2)

   ii. අංක 01 චතුරස්‍රවල දැක්වෙන රාජ්‍ය ආයතන හතරක් නම් කරන්න (2)

   iii. A144 ප්‍රධාන මාර්ගයේ දිග කිලෝමීටර්වලින් ලියා දක්වන්න.(2)

   iv. නිරිත දිග කාර්තුවේ + ලක්ෂණයෙන් පෙන්නුම් කරන දේශාංශ වටිනාකම ලියා දක්වන්න (2)

   v. 230 ලෙස දක්වා ඇති ජාලක වටිනාකම මීටර්වලින් ලියා දක්වන්න (2)

   vi. අංක 01 ලෙස දක්වා ඇති චතුරස්‍රය 1:25000 සිතියමක කොටසක් ලෙස නිරූපණය කිරීමේ දී නව රාමු ඇද රේඛිය පරිමාණය ඇද දක්වන්න (4)

   vii. සිතියම්ගත ප්‍රදේශයේ කෘෂිකාර්මික භූමි පරිභෝගය පිළිබඳව විස්තර කරන්න (6)

2. ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘතික සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න. සම්මත වර්ණ හා ක්‍රමවේදයන් භාවිතා කිරීම සඳහා සැළකිළිමත් වන්න.

   i. නොර්වේ
   ii. ටිබෙට් සානුව
   iii. මලක්කා සමුද්‍ර සංන්ධිය
   iv. මෙක්සිකෝබොක්ක
   v. ලන්ඩන් නගරය
   vi. මියුරි මිසිසිපි ගඟ
   vii. මැඩගස්කර් දූපත්
   viii. 2023 ලෝක කුසලාන ක්‍රිකට් සූරතාවය දිනූ රට
   ix. අප්‍රිකානු කලාපයේ ජනාධිකම රට
   x. ලෝකයේ මානව හිමිකම් මුලස්ථානය පිහිටි රට(10)

EDNCP

## III කොටස

3. පහත දැක්වෙන්න ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

   i. සිතියමක ඇතුලත මායිම් තිරුව තුළ දක්නට ලැබෙන ලක්ෂණ මොනවාද (2)

   ii. සිතියමක දිශාව දක්වන රූප සටහන ඇඳ කෙටියෙන් විස්තර කරන්න (4)

   iii. 1: 50000 සිතියමක දිග සෙ.මී 4ක් හා පලළ සෙ.මී 4ක් වන අතර එය දෙගුණයකින් විශාල කළ විට නව රාමුව ඇඳ හා එහි රේඛිය පරිමාණය ඇඳ දක්වන්න (4)

   iv. පහත දැක්වෙන මාතෘකා අතින් දෙකකට කෙටි සටහන් සපයන්න (5)

      A. සිතියම් වර්ග
      B. සිතියම් පරිහරණය
      C. මුහුණත තොරතුරු
      D. වෙරළබඩ ලක්ෂණ
      E. සිතියමක පරිමාණය

4 i. නව සිතියම් විද්‍යාව යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද (2)

ii. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ තාක්ෂණය ක්‍රියාත්මක වන විස්තර කර දක්වන්න (2)

ii. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ ප්‍රධාන කොටස් කෙටියෙන් විස්තර කරන්න (6)

iii. නව සිතියම් විද්‍යාත්මක ක්‍රම භාවිතයේ ඇති වාසි හා අවාසි සාකච්ඡා කරන්න (5)

5 i. භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය යන්න නිර්වචනය කරන්න (2)

ii. GIS මූලිකාංග නම් කර ඉන් මූලිකාංග දෙකක් කෙටියෙන් විස්තර කරන්න (4)

iii. භූගෝල විද්‍යා තොරතුරු පද්ධතියේ අවකාශීය දත්ත නිරූපණය කරන ආකෘති දෙක පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න (5)

iv. දෛශික හා අංකික සිතියමක් අතර වෙස්කම් හතරක් නම් කරන්න (4)


6 i. දුරස්ථ සංවේදන ක්‍රියාවලියේදී අභ්‍යවකාශ වේදිකා ලෙස භාවිතා කරන යානා දෙකක් නම් කරන්න (2)

ii. භූගෝලීය තොරතුරු පද්ධතියේ වැදගත්කම් තුනක් විස්තර කරන්න (6)

iii. භූගෝලීය තොරතුරු පද්ධතිය සඳහා GPS yd RS වල දායකත්වය පැහැදිලි කරන්න (4)

iv. අපදා කළමණාකරණයේ දී හා ව්‍යාපෘති සැළසුම්කරණයේ දී නව සිතියම් විද්‍යාව භාවිතා කරන ආකාරය විස්තර කරන්න (5)

EDNCP


© 2009 www.outline-world-map.com

සියලුම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 12

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂය :-..........................................................................

පාසලේ නම :- ..........................................................................

ඇතුළත්වීමේ අංකය : .............................. කාලය :

**භූගෝල විද්‍යාව 11**
**Geography 11**

**22** **S** **II**

*පැය තුනයි විනාඩි දහයයි.*
*Three hours&10 minutes*

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වයක් දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න**

**උපදෙස් :** - එක් කොසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න

## පළමු කොටස - භෞතික භූගෝල විද්‍යාව

1 I. භූගෝල විද්‍යාව යන්න නිර්වචනය කරන්න (2)

II. '' භූ දර්ශනයේ අවකශීය විවිධත්වය'' යන්න කුමක්දැයි හඳුන්වා එය කරුණු හතරක් ඔස්සේ සාකච්ඡා කරන්න (6)

III. භෞතික භූ දර්ශණය මත මානුෂ භූ දර්ශණය ගොඩනැගෙන ආකාරය සුදුසු උදහරණ ඇසුරෙන් විස්තර කරන්න (6)

IV. භෞතික භූ දර්ශණය විනාශ වීමට හේතුවන මානව ක්‍රියාකාරකම් හතරක් විස්තර කරන්න (6)

2 I. පාංශු පැතිකඩ ඇද කොටස් නම්කරන්න (4)

II. පස නිර්මාණය වීම කෙරෙහි බලපාන සාධක හතරක් නම්කර ඉන් දෙකක් විස්තර කර දක්වන්න. (ල.6)

III. ශ්‍රී ලංකාවේ වියළි කලාපයට අයත් පස්වර්ග දෙකක් හා තෙත් කලාපයට අයත් පස්වර්ග දෙක බැගින් නම් කරන්න. (ල.4)

IV. ඔබ නම්කළ පස්වර්ග දෙකක් උදාහරණ ලෙස ගෙන විස්තර කර දක්වන්න. (ල.8)

3 I. යමහල් ව්‍යාප්ති කලාප ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න (2)

II. යමහල් ක්‍රියාකාරිත්වය නිසා නිර්මාණය වන නිෂ්ක්‍රාන්ත භූ රූප දෙකක් හා ආක්‍රාන්ත භූ රූප දෙකක් රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න (8)

III. භූ තැටි චලනය වීම නිසා ඇතිවන බලපෑම් හතරක් නම් කරන්න (4)

IV. ඉහත ඔබ නම් කළ බලපෑම් තුනක් ගෙන කෙටියෙන් විස්තර කරන්න (6)

EDNCP

4 I. පහත සඳහන් භූරූප නිර්මාණ කාරක නම් කරන්න (4)

**(ගවුර්, ගල්වන, පිත්තපටි විල්, ටොම්බෝලාව, සර්කර්, හුණුගල් ගුහා, උඩු නැම්, සුවිභේදය)**

II. ශුෂ්ක ප්‍රදේශවල සිදුවන ඛාදන හා පරිවහන විධික්‍රම විස්තර කරන්න (ල 4.)

III. ශුෂ්ක ඛාදනය ආශ්‍රිත භූරූප දෙකක නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් ආධාරයෙන් විස්තර කරන්න (6)

IV. කාන්තාරවල ජලයආශ්‍රිත භූරූප නිර්මාණ ක්‍රියාවලිය රූපසටහන් දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න (6)

## දෙවන කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5 I. a) භූගෝල විද්‍යා අධ්‍යයනයක් යනු කුමක් ද

b) එය අනෙක් අධ්‍යයන ක්ෂෙත්‍ර අතරින් සුවිශේෂි වන්නේ ඇයි (4)

II. සෑම විටම භූගෝල විද්‍යා අධ්‍යයනයන් තුළ කාලය හා අවකාශීය ව්‍යාප්තීන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කර ඇත. නිදසුන් සහිතව විස්තර කරන්න. (6)

III. ලෝකයේ මානුෂ කටයුතුවල ව්‍යාප්තිය භෞතික සාධක මත නිර්මාණය වීම විශේෂත්වයකි. නිදසුන් සපයමින් කරුණු හතරක් ඔස්සේ විස්තර කරන්න(6)

IV. මානුෂ ක්‍රියාකාරකම් නිසා නිර්මාණය වී ඇති ගෝලීය පාරිසරික ගැටළු හතරක් නම් කරන්න (4)

6 I. ආසියානු මහද්විපයේ ප්‍රදේශයේ ජනහීන කලාප 2ක් හා ජනාධික කලාප 2ක් සඳහා නිදසුන් ගෙනහැර දක්වන්න (4)

II. ඔබ නම්කළ එක් ජනාධික කලාපයක ජනයා අධිකවීම කෙරෙහි බලපාන ලද සාධක හතරක් විස්තර කර දක්වන්න (6)

III. ශ්‍රි ලංකාවේ ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය අසම සම වේ. එයට බලපෑ භෞතික හා මානව සාධක හතරක් නිදසුන් සහිතව විස්තර කරන්න (6)

IV. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ජනාධික බව නිසා නිර්මාණය වු ගැටළු අවම කරගැනීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග හතරක් විස්තර කරන්න (6)

7 I. පාරිභෝගික කෘෂිකර්මාන්තය හා වානිජ කෘෂිකර්මාන්තය අතර වෙනස පැහැදිලි කරන්න (2)

II. ශ්‍රී ලංකාවේ මෑතකාලීනව පාරිභෝගික කෘෂිකර්මාන්තයේ ඇතිවී තිබෙන වෙනස්කම් තුනක් විස්තර කරන්න (6)

III. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රසාරණය සඳහා දායක වන ප්‍රධාන අංශ තුන විස්තර කර දක්වන්න. (6)

IV. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ හදුනාගත හැකි අභියෝග හතරක් විස්තර කරන්න (6)


8 I. නාගරීකරණ දර්ශකය ලියා දක්වන්න (2)

II. නාගරීකරණය කෙරෙහි බලපාන සාධක තුනක් විස්තර කර දක්වන්න (6)

III. ලෝක නාගරීකරණය ආශ්‍රිතව හදුනාගත හැකි සුවිශේෂි ලක්ෂණ හතරක් විස්තර කරන්න (6)

IV. ලෝකනාගරීකරණය ආශ්‍රිතව සමාජ ආර්ථීක ගැටළු තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න (6)

EDNCP


© 2009 www.outline-world-map.com